දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.

අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.

තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තමිළිනිගේ කතාව

## 13

විශාල හමුදා කඳවුරු පිහිටීම සිතුවම් කෙරෙන ව්‍යුහයන් සහිත විශාල සිතියම් වටා අපි උන්නෙමු. කාන්තා බළඇණියේ විශේෂ සෙන්පතිනි අප ඉදිරියෙහි වූ අනුරුව පෙන්වා 'මේ ස්ථානය මොකක්ද කියලා දන්න අය කියන්න බලන්න.' යැයි පැවසුවාය. මුහුදත් මුහුදු ආශ්‍රිත එළිමහන් ප්‍රදේශයත් සහිත භූමි පෙදෙසක පිහිටි හමුදා කඳවුරක දර්ශනය චිත්‍රණය කරන අයුරින් එම ආදර්ශ සිතුවම සකස්ව තිබිණ. 'අලිමංකඩ, මුලතිව්...නෑ. නෑ. අලිමංකඩ තමයි' යැයි සටන්කාමී සහෝදරියෝ විවිධ අනුමානයන් ඉදිරිපත් කළහ. ටික වේලාවක් නිහඬව බලාගෙන උන් සෙන්පතිනි සියලු දෙනාටම සන්සුන්ව සිටින ලෙස දැනුම් දුන්නාය.

'හැම දෙනාම හොඳින් අවධානය යොමු කරන්න. මේක තමයි පුනගරී හමුදා කඳවුරේ සිතියම. අපි මෙච්චර දවසක් පුහුණුව ලැබුවේ පුනගරී හමුදා කඳවුර විනාශ කරන්ඩයි. මේක මුහුදයි ගොඩබිමයි එකට එක්ව තියන හමුදා කඳවුරක්. ඒ නිසා එකම මොහොතෙදි මේ හමුදා කඳවුරට ගොඩබිමෙන් හා මුහුදෙන් පහරදීමේ සැළැස්මක් සංවිධානය හදලා තියනවා.' 1993 අවසන් වසරේ අවසන් භාගයේ දී අච්චුවේලි ප්‍රදේශයෙහි පිහිටා ඇති වල්ලෙල එළිමහන් ප්‍රදේශය ආශ්‍රිත මුහුදු කලපුව ප්‍රදේශයෙහි හමුදා කඳවුරක අනුරුවක් පිහිටුවා අපේ කණ්ඩායම් සඳහා පුහුණුවීම් සිදු කළේය. එම අනුරුව කුමන හමුදා කඳවුරෙහිද යන්න අපට තේරුම් ගියේ මෙම අවස්ථාවේදීය. මා පළමු වතාවට සම්බන්ධ වූ විශාල ප්‍රහාරය වූයේ පුනගරි හමුදා කඳවුරට එල්ල කළ ප්‍රහාරයයි.
පහළොස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක වගකීම මා වෙත පැවරීය. යාපනය මුහුදු කලපු ප්‍රදේශයෙහි දිවා රෑ නොබලා දැඩි දුෂ්කර පුහුණුවීම් වලට අපේ කණ්ඩායම යොමු කළේය. ත්‍රිකුණාමලයේ උපන් සටන්කාමී සහෝදරියක වූ මේජර් සුමංගලා හතළිස් පස් දෙනෙකුගෙන් සමන්විත අපේ කණ්ඩායමේ වගකීම් දැරුවාය.

# 'වෙන්ව යන මොහොතේ... නුඹේ අවසන් හුස්ම පොද... සිහිකළේ කාවද කියනු මැන'

මෙම ප්‍රහාරක කටයුතු සඳහා විමුක්ති සංවිධානය වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ කටයුතු සූදානම් කළේය. වන්නියෙන් සහ යාපනයෙන් ප්‍රහාරක පුහුණුව ලැබූ සටන්කාමීන්ගෙන් යුක්ත වූ පන්දහසකටත් අධික වූ ප්‍රහාරක බල ඇණියක් මෙම ප්‍රහාරයට සම්බන්ධ විය. කාන්තා බල ඇණියෙහි පමණක් දාහක පමණ පිරිසක් මෙම ප්‍රහාරය සඳහා සූදානම්ව උන්හ. පුනගරි හමුදා කඳවුර පිළිබඳව ඔත්තු බැලීමේ කටයුතුවලද කාන්තා බල සේනාවේ අය ආරම්භයෙහි සිට නිමග්නව උන්හ. එමෙන්ම මුහුදු මාර්ගයෙන් සිදුකළ ප්‍රහාරවල දී මුහුදු කොටි අංශයට අයත් සටන්කාමී සහෝදරියෝ විශාල ප්‍රමාණයක් දායකත්වයක් දැක්වූහ. මාස ගණනාවක් තිස්සේ සිදුකළ විශේෂ පුහුණුවීම් සමඟ ඉතාමත් රහසිගත ආරක්ෂක කටයුතු ද සිදුකළේය.

පුනගරි හමුදා කඳවුරට පහර දී විනාශ කිරීම තුළින් යාපනය සඳහා වන පිවිසුම් මාර්ගය ලෙස පවතින අලිමංකඩ හමුදා කඳවුර දුර්වල කිරීමත්, වන්නිය සහ යාපනය අතරෙහි කිලාලි කළපුව හරහා වන පාර කොටි සංවිධානයෙහි පාලනය යටතට ගෙන ඒමත් යාපනය සම්පූර්ණයෙන්ම අත්පත් කරගැනීමේ ශ්‍රී ලංකා හමුදාවේ සැළසුම ව්‍යර්ථ කිරීමත් කොටි සංවිධානයෙහි අරමුණ විය.

කොටි සංවිධානයෙහි ප්‍රහාරක ඉතිහාසය තුළ හමුදා සහ නාවික ඒකාබද්ධ හමුදා කඳවුරක් කෙරෙහි ගොඩබිමින් සහ මුහුදින් සටන් පෙරමුණු දෙකක ප්‍රහාරය වූයේ මෙයයි. එහෙයින් මෙම ක්‍රියාන්විතය 'ඔපරේෂන් තවලෙ' (ගෙඹි මෙහෙයුම) නමින් සංවිධානය විසින් නම් කරන ලදි.

සංවිධානයෙහි බුද්ධි අංශයෙහි වගකීම් දැරූ පොට්ටු අම්මාන් වෙත මෙම ක්‍රියාන්විතය ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන වගකීම පැවරී තිබුණි. පොට්ටු අම්මාන් බොහෝ අවස්ථාවල මා මුහුණට මුහුණ මුණගැසී තිබුණත්, ඔහුගේ ප්‍රහාර පිළිබඳව සජීවීව කෙරෙන පැහැදිලි කිරීම්, අත්දැකීම් මට පුනගරී පුහුණු කිරීම්වලදී ලබා ගත හැකි විය.



යාපනයේ සිට අපේ කණ්ඩායම් කිලාලි මුහුදු කලපුව මාර්ගයෙන් වන්නියට යැව්වේය. රාත්‍රී කාලයෙහි ලොරිවල නංවා අම්බකාමම් කැලෑ ප්‍රදේශයෙහි පිහිටි කඳවුරකට කැඳවා ගෙන ගියෙමු. එහිදී දින දෙකක කාලයක් ප්‍රහාරය සඳහා වන අවසන් සූදානම් කිරීම් කටයුතු සිදු කෙරුණි. සියලු දෙනාටම ගෝණිවලින් මැසූ තොප්පියක්, තුවක්කු සඳහා වන අමතර උණ්ඩ, අත් බෝම්බ, දුරස්ථ සම්බන්ධතාවන් උදෙසා වන රහස්‍ය සංඛේත, දුරස්ථ සම්බන්ධතා උපකරණ සඳහා අමතර බැටරි, වියලි ආහාර පාර්සල් ආදිය එහිදී සම්පූර්ණ කළේය.

බොහෝ සටන්කාමීහු තම පවුල්වල අය සඳහා අවසන් ලිපිය ලියමින් සිටියහ. මගේ කිට්ටු මිතුරියෝ ද මෙම ප්‍රහාරයට සම්බන්ධ වූහ. ඒ සෑම දෙනෙකුටම තමන්ගේම සිහින, බලාපොරොත්තු, විශ්වාසයන්, අවිශ්වාසයන්, ජීවිතය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වය ප්‍රකාශ කළ නොහැකි අසහනය තිබුණි. නිශ්චිත වූ යුද්ධයකට සම්බන්ධ වන සටන්කාමීන්ගේ අවසන් මොහොතේ නෙත්වල රැඳී පවතින හැඟීම් තේරුම් ගැනීමට හැකි කිසිවෙකුත් නැවතත් යුද්ධයක් පිළිබඳව කතා කරනවා තබා සිතන්නේවත් නැත.

පුනගරියේ වෙල් යායවල් ද, නොවැම්බර් මස ඇද හැලෙන අඛණ්ඩ වර්ෂාව ද 1993 වසරෙහි සැප්තැම්බර් මාසයෙහි එකළොස්වන දින ආරම්භ කළ එම යුද්ධය මහත් උග්‍ර තත්ත්වයට පත් කිරීමට හේතු විය. ප්‍රහාරය ආරම්භ කළ පළමු දින තුන ඇතුළත දී පන්සියකටත් වඩා අධික සටන්කාමී පිරිසක් වීර මරණයට පත්වූහ. සංවිධානයෙහි ඉතිහාසයෙහි පළමු වතාවට ලංකා හමුදාවේ යුද්ධ ටැංකියක් අත්පත් කරගැනීමට කොටි සංවිධානයට හැකිවිය. එම යුද්ධ ටැංකිය පුනගරියේ සිට කොටින්ගේ ප්‍රදේශයට රැගෙන එන මාර්ගයෙහි පිහිටා ඇති බංකර සහ කටුකම්බි ඉවත් කර වහාම පාර සකස් කරන මෙන් අපේ කණ්ඩායමට අණ ලැබිණ.

36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com